**කොළඹ මහා නගර සභාව.**

**කොළඹ දිස්ත්‍රික්කය**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017ඔක්තෝබර් 23 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 දෙසැම්බර් 18 දින නාගරික කොමසාරිස් වෙත යවන ලදි.

### 1.2 අභිතකර මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට කොළඹ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ ගණනාවක සිට පැවත එන ආපසු ගෙවිය යුතු තැන්පතු රු.477,218,614 ක් ආදායමට ගැනීමේදී අධිකතා ඌනතා ගිණුමට බැර කිරීම වෙනුවට වර්ෂයේ ආදායමට ගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) මහා නගර සභාවකට ලැබෙන සියළුම මුදල් මහා නගර සභා අරමුදල නමින් හඳුන්වනු ලබන ගිණුමකට බැර කල යුතු වුවද විවිධ පරිත්‍යාගශීලීන්ගෙන් ලැබුණු රු.32,746,905 ක මුදලක් කොළඹ නගර සංවර්ධන අරමුදලට බැර කර නගර සංවර්ධන අරමුදල නමින් රු.25,368,547 ක් ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කර තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විගණන ගාස්තු රු.6,273,800 ක් වුවද ණයහිමියන් යටතේ ගෙවිය යුතු මුදල ලෙස රු.4,538,800 ක් දැක්වීම හේතුවෙන් ණයහිමියන් රු.1,735,000 ක් අඩුවෙන් ගිණුමේ දක්වා තිබුණි.

(ඈ) 2016 වර්ෂයේ දේපළ ණය පොළී ආදායම රු.12,141,968 ක් වුවත් ආදායම් වියදම් ගිණුමෙහි රු.13,277,300 ක් ලෙස සටහන් කර තිබීම නිසා දේපල ණය පොළී ආදායම රු.1,135,332 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල වැටුප් ප්‍රතිපූර්ණ මුදල රු.2,862,420,446 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.2,868,534,283 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු.6,113,837 කින් වැඩියෙන් දක්වා තිබුණි. 2016 පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද වැටුප් ප්‍රතිපූර්ණ මුදල ලේඛණයෙහි වරදවා සටහන් කිරීම නිසා 2015 හා 2016 දෙසැම්බර් සඳහා සංශෝධිත ගිණුම්වල ජ'නල් සටහන් 67 හා 68 මඟින් රු.238,535,037 ක් බැගින් හර හා බැර කිරීමෙන් අධිකතා හා ඌණතා ගිණුම හා විවිධ ණයගැති ගිණුම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) පොදු ජලකණු 08 ක් හා නාන කරාම 06 ක් සඳහා වැය විෂයයන් 07 කින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට 2008 ජනවාරි 01 දිනට ගෙවිය යුතු මුළු හිඟය රු.12,262,178 ක් වුවත් මේ සඳහා ගෙවීම් කිරීමට හෝ ණයහිමි ප්‍රතිපාදන සැලසීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2016 දෙසැම්බර් 31 දිනට ගබඩාවෙන් ඉදිරිපත් කරන ලද තොග සත්‍යාපන වාර්තාවල දැක්වෙන තොග ශේෂයන්ට වඩා රු.1,705,095 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) 2016 වර්ෂයට අදාල කල්බදු කඩ සාප්පු ආදායම රු.20,013,054 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.8,576,406 ක් ලෙස පෙන්වීමෙන් කල්බදු කඩ සාප්පු ආදායම රු.11,436,648 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

(අ) ගිණුම් විෂයයන් 56 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු.18,607,853,016 ක් වූ නමුත් ඊට අදාල උපලේඛනවල දැක්වෙන වටිනාකම රු.11,309,047,875 ක් වූයෙන් රු.7,298,805,141 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් පහත සඳහන් අතැති මුදල් හා බැංකු ගිණුම් ශේෂ සරප් අංශයේ මුදල් පොත් අනුව නොසැසඳුනි.

**(i) <u>අතැති මුදල්</u>**

| විස්තරය | මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති වටිනාකම (රු.) | සරප් අංශයේ මුදල් පොත් අනුව වටිනාකම (රු.) | පරිගණක තොරතුරු පද්ධතියෙන් ලබාගත් වටිනාකම (රු.) |
|---|---|---|---|
| අතැති චෙක්පත් | 1,013,906,939 | 1,262,903,276 | 1,245,881,545 |
| අතැති මුදල | 1,371,662 | 18,176,905 | 1,371,662 |

**(ii) <u>බැංකු ගිණුම් ශේෂ</u>**

බැංකු ගිණුම් 04කට අදාලව 2016.12.31 දිනට අවසාන ගිණුමේ දැක්වෙන මුදල් පොතේ ශේෂයන් හා බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව මුදල් පොතේ ශේෂයන් අතර ප්‍රමාණාත්මක වෙනස්කම් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ 16 කට පෙර සිට පැවත එන රු.64,247,278 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂයන් 18 ක වටිනාකම නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් නිළධාරීන් වෙත ලබා දී ඇති සුළු මුදල් හා විශේෂ අත්තිකාරම් ගිණුම් ශේෂය රු.3,911,402 ක් විය.

(ඇ) දේශීය ආදායම් බදු පනත යටතේ එකතු කරන ලද රු.17,974,658 ක බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය නොකර ගෙවිය යුතු තැන්පත් ගිණුමේ දක්වා තිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

(අ) එකතුව රු.14,539,311,239 ක් වූ ගිණුම් විෂයයන් 10 කට අදාල සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ආ) 2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කිරීමෙන් පසුව 2017 ඔක්තෝබර් 23 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කළ අතර ආදායම් විෂයයන් 09 කින් රු.235,027,401 ක්ද, වියදම් විෂයයන් 08 කින් රු.60,799,546 ක්ද, වත්කම් අයිතම් 17 කින් රු.535,851,001 ක්ද, වගකීම් එක් අයිතමයකින් රු.11,436,640

ක්ද සංශෝධනයන් සිදු කර තිබුණි. මෙම සංශෝධන සඳහා අදාල ජ'නල් වවුචර් හා ඊට අදාල උපකාරක ලියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) පිළිතුරු නොලත් විගණන විමසුම්**

**-------------------------------------**

2016 වර්ෂය වෙනුවෙන් 2017 ජුලි 30 දින දක්වා නිකුත් කළ විගණන විමසුම් 42 ක් අතුරින් නොවිසඳී ඇති විගණන විමසුම් වටිනාකම රු.1,354,114,060 ක් වූ අතර පිළිතුරු නොලත් විගණන විමසුම් සංඛ්‍යාව 24 ක් විය.

**1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

**-----------------------------------------------------**

**(අ) මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය)**

**--------------------------------------------------**

**(i)** 28 වගන්තිය අනුව මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව විසින් සලකා බලා මහා සභාවට වාර්තා කරන තෙක්, මහා නගර සභාවක් විසින් කිසිම මුදල් පිළිබඳ කරුණක් සම්බන්ධයෙන් අවසාන වශයෙන් ක්‍රියා නොකළ යුතු වුවද ඊට පටහැනිව පාසිකුඩාහි පැවති නේවාසික වැඩමුළුව වෙනුවෙන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව රු.3,569,375 ක වියදමක් දරා තිබුණි.

**(ii)** 230 (4) වගන්තිය අනුව පළාත් පාලන හා නිවාස අමාත්‍යවරයා විසින් නිකුත් කර ඇති 1988 පෙබරවාරි 19 දිනැති අංක 494 දරන ගැසට් පත්‍රය අනුව වරිපනම් බදු කලින් ගෙවන්නන් හට ජනවාරි 31 දිනට පෙර හෝ එදින ගෙවන්නේ නම් සියයට 10 ක වට්ටමකට හා වාරික මගින් ගෙවනු ලබන්නේ නම් මුල් මාසය ඇතුලත සියයට 5 ක වට්ටමකට හිමිකම් ලැබිය යුතුය. ඒ අනුව වරිපනම් බදු ගෙවන්නන් හට සියයට 10 ක හා සියයට 5 ක වට්ටම් ලබා ගැනීමට හිමිකමක් පවතින නමුත් පසුගිය වර්ෂයන්ට අදාල හිඟ ශේෂ එසේම තිබියදී ප්‍රවර්තන වර්ෂයට අදාල ගෙවීම් සඳහා වට්ටම් ලබා දී තිබුණි. ඉහත කී ගැසට් නිවේදනයට පටහැනිව හිඟ ශේෂ පවතින දේපළ 109 ක් වෙනුවෙන් රු.248,558,166 ක් වට්ටම් වශයෙන් ලබාදී තිබූ බව නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

**(iii)** 247 වගන්තිය අනුව වෙළඳ ව්‍යාපාර බදු වලට අදාල ව්‍යාපාර හඳුනාගැනීම, ව්‍යාපාර වර්ගීකරණය කිරීම, බදු පැනවීමට අදාල මූලික කටයුතු සම්පාදනය කිරීම හා බදු ගෙවීම පැහැර හරින්නන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීම සිදුකල යුතු වුවත් එසේ කටයුතු නොකිරීම නිසා වර්ෂ ගණනාවක සිට සභාවට සැලකිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.

**(iv)** 254 අ (1) හා (2) අනුව සභාවට අයවිය යුතු යම් බද්දක්, දඩ මුදලක්, දන්ඩන මුදලක්, දඩුවම් වශයෙන් වූ ගෙවීමක් , ගාස්තුවක් හෝ වෙනත් ගෙවීමක් මහා නගර සභාවට අයවිය යුතුව තිබෙන අවස්ථාවක එම මුදල අයකර ගෙන එය මහා නගර සභාවේ අරමුදල් වලට බැර කිරීම සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු වුවත් 2016 දෙසැම්බර් 31 දිනට අය විය යුතු රු.3,586,549,919 ක් වූ හිඟ මුදල් අය කර නොතිබුණි.

**(ආ) කොළඹ මහා නගර සභා ආඥා පනතේ අනු නීති viii පරිච්ඡේදය අංක 34 ඡේදය**

**------------------------------------------------------------------------------------**

**(i)** වෙළෙඳ අපද්‍රව්‍ය ඉවත් කිරීම වෙනුවෙන් 2016 ජූනි 30 දින වන විට හිඟ ආදායම රු.27,293,400 ක් වූ අතර,අනු නීති පරිච්ඡේදය xxv ප්‍රකාරව ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ii)** වෙළඳ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ගාස්තු රැස්කිරීම වෙනුවෙන් සභාව විසින් නිකුත් කරනු ලබන වාර්ෂික නිවේදන අංක 4 දිස්ත්‍රික් කාර්යාල විසින් 2016 ඔක්තෝබර් 11 දින වන විටත් නිකුත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**

**(i)** මු.රෙ. 395 (ඇ) ප්‍රකාර එක් එක් මාසය අවසානයේ දී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවද බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම දින 40 සිට දින 290 දක්වා ප්‍රමාද වූ අවස්ථා අනාවරණය විය.

**(ii)** මු. රෙ. 751 ප්‍රකාර ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ තොග සම්බන්ධයෙන් තොග ලැබීම් හා නිකුත් කිරීම් වාර්තා කිසිවක් නඩත්තු නොකරන බව නිරීක්ෂණය වූ අතර, ෆෝම් සාන්ද්‍රණයන් වල ආරක්ෂාව සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි.

**(iii)** මු.රෙ.1653 ප්‍රකාර දිසා කාර්යාල 04 සතු වාහන 32 ක මයිලෝ මීටරය අක්‍රීය වී තිබියදී ධාවනයට යොදවා තිබුණි.

**(ඈ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදය අනුව නිවාස වර්ගීකරණය කර ඒ අනුව පොරොත්තු ලේඛනයට, ඉල්ලුම්කරුවන්ගේ නම් ඇතුලත් කර එම අනුපිළිවෙල අනුව නිවාස වෙන්කර දියයුතු වුවත් සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**(ඉ)** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8.1 (අ) වගන්තියට පටහැනිව ඝණ අපද්‍රව්‍ය පවිත්‍රතා අංශයේ හදිසි මිලදී ගැනීම් යටතේ ටිපර් රථ 06 ක් පුද්ගලික සමාගමකින් කුලී පදනම මත ලබාගෙන රු.59,628,833 ක මුදලක් 2015 ජුනි සිට 2017 මැයි 12 දක්වා ගෙවා තිබුණි.

**(ඊ)** 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව, නිල වාහන අනුයුක්ත කිරීමට හිමිකම් නොමැති නිලධාරීන් සඳහා වාහන සහ ඒ සඳහා ඉන්ධන ප්‍රතිපාදන කිරීමට හැකියාවක් ඇත්නම් පමණක් කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැලසීමට කටයුතු කල යුතු වුවත් ඊට පටහැනිව නිලධාරියෙකුට එක් වාහනය බැගින් වෙන්කර ප්‍රවාහන පහසුකම් සපයා දී තිබුණි.

**(උ)** 1988 සැප්තැම්බර් 20 දිනැති අංක 08 දරන නාගරික සංවර්ධන අධිකාරි චක්‍රලේඛය අනුව, නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පවත්වාගෙන යන බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂ අවසාන ශේෂය වූ රු.689,014,313 ක මුදල දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ඌ)** 2008 පෙබරවාරි 21 දිනැති අංක 1534/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව, මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ හැර අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම නොකළ යුතු වුවද ටිපර් රථ කුලීයට ගැනීමේදී අදාල ආයතනය බලපත්‍රයක් ලබාගෙන තිබේද යන්න සභාව විසින් ටෙන්ඩර් පිරිනැමීමට පෙර පරීක්ෂා කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදමට වඩා වැඩිවූ ආදායම රු.4,042,313,090 ක්වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ සභාවේ පුනරාවර්ථන ආදායමට වඩා වැඩි වියදම රු.569,949,762 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,612,262,852 ක වර්ධනයක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්ථන ආදායම රු.5,004,505,835 කින් වැඩි වී තිබීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පෙර වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේ පුනරාවර්තන ආදායම් වැඩිවීම සියයට 76 ක් වූ අතර ගාස්තු හා අයකිරීම් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 987 කින් වැඩිවීම ඊට හේතු වී තිබුණි. මෙසේ ගාස්තු හා අයකිරීම් වැඩිවීම සඳහා පසුගිය වර්ෂ ගණනාවක සිට පැවත එන ආපසු ගෙවිය යුතු තැන්පත් ශේෂ රු.මි.477.2 ක් ආදායමට ගැනීම හා මුද්දර බදු, ගාස්තු හා අයකිරීම් යටතේ වර්ගීකරණය කිරීම මේ සඳහා හේතු වී තිබුණි.

(ආ) වරිපනම් හා බදු සියයට 27 කින් ද, කුලී ආදායම් සියයට 3 කින් ද පොළී ආදායම සියයට 12 කින්ද වැඩි වී තිබුණි.

(ඇ) ප්‍රාග්ධන ලැබීම් යටතට රු.මි.8 ක් වූ කල්බදු කඩසාප්පු ආදායම් ලැබීමක් හා රු.මි.34 ක ව්‍යාපෘති ආධාර යටතේ ජපන් රජයෙන් ලද ඝණ අපද්‍රව්‍ය ලොරි 12 ක ලැබීම් ඇතුළත් වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල ප්‍රාග්ධන මූල්‍යකරණ පිරිවැය ලෙස ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගත් ණය වෙනුවෙන් ණය පොළී සඳහා රු.මි.60.6 ක වියදම් දැරීම පෙර වර්ෂයට වඩා ප්‍රාග්ධන මූල්‍යකරණ පිරිවැය සියයට 245 කින් ඉහළ යාමට බලපා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ආයතනික හා විවිධ වියදම් පෙර වර්ෂයට වඩා සියයට 51.6 කින් වැඩි වී තිබුණු අතර ඝණ අපද්‍රව්‍ය රැස්කිරීම හා බැහැරලීම සඳහා රු.මි.1294 ක වැයක් දරා තිබුණි. එහි වැඩිවීම පෙර වර්ෂයට වඩා සියයට 62 ක් විය.

(ඊ) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ වත්කම් වැඩිවීම රු.3,146,961,642 ක් වී තිබුණි. මේ සඳහා කෙරීගෙන යන වැඩ ලෙස රු.349,129,555 ක මුදලක් ප්‍රවර්තන වර්ෂයේදී හඳුනාගෙන තිබීම, රු.684,123,615 ක ප්‍රමාණයකින් ණයහිමියන් අඩු වීම හා අතැති චෙක්පත් අගය රු.916,484,421 කින් වැඩි වීම යන කරුණු බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

---------------------

#### 2.3.1 වරිපනම්

----------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට මුළු හිඟ වරිපනම් වටිනාකම රු.2,593,828,007 ක් විය. එම මුළු හිඟ වරිපනම් ශේෂ අතරින් රු.500,000 ක් ඉක්ම වූ දේපළ 650 ක් වූ අතර එහි හිඟ වරිපනම් බදු වටිනාකම රු.1,348,595,164 ක් විය. එය මුළු හිඟයෙන් සියයට 52 ක ප්‍රතිශතයක් විය.

(ආ) වාර්ෂික වරිපනම් වටිනාකම රු.1,000,000 ක් වූ දේපළ සංඛ්‍යාව 297 ක් වූ අතර එහි 2016 දෙසැම්බර් 31 දිනට හිඟය රු.1,100,665,942 ක් විය. එය මුළු හිඟයෙන් සියයට 42 ක් විය.

(ඇ) කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවතින රජයේ දේපළ අතරින් 182 ක හිඟ බදු වටිනාකම රු.517,110,341 ක් විය. මෙය මුළු හිඟයෙන් සියයට 20 ක් විය.

(ඈ) රු.500,000 ට වැඩි හිඟ ශේෂයන් පවතින දේපළ අතරින් 2016 වර්ෂය තුලදී කිසිදු වරිපනම්

මුදලක් අයනොවූ දේපළ 496 ක් වූ අතර එහි මුළු හිඟය රු.967,015,990 ක් විය.

(ඉ) පසුගිය ආසන්න වසර 05 ක් තුල හිඟ වරිපනම් අයවීම ප්‍රතිශතයක් ලෙස සියයට 14.4 සිට සියයට 29.5 ක පරාසයක් දක්වා විහිදී තිබූ අතර මේ අනුව හිඟ අයවීම දුර්වල මට්ටමක තිබුණි.

(ඊ) නියමිත පරිදි වරිපනම් ගෙවන්නන් හා නොගෙවන්නන් සඳහා සමාන ලෙස වට්ටම් ලබා දීම මගින් නියමිත පරිදි වරිපනම් ගෙවන්නන් හට සෘණාත්මක බලපෑමක් සිදුවන අතර සභාව තුල දැනට පවත්නා තොරතුරු තාක්ෂණ මෙහෙයුම් පද්ධතිය (AS400) තුළ තක්සේරුකරණය සම්බන්ධව විෂය ක්ෂේත්‍රයක් අන්තර්ගත වී තිබුණද එම ක්ෂේත්‍රය යාවත්කාලීන කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**2.3.2 වෙළෙඳ බදු හා ව්‍යාපාර බදු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන ගිණුමෙහි ව්‍යාපාර හා වෙළෙඳ බදු වශයෙන් මුදල් පදනම මත රු.26,221,470 ක් පෙන්වා තිබූ අතර එහි පෙර වර්ෂය වෙනුවෙන් ලැබූ ආදායම් වැඩි ප්‍රමාණයක් ඇතුලත් වී තිබුණි.2016 වර්ෂයේ ව්‍යාපාර හා වෙළඳ බදු වශයෙන් රු.67,796,000 ක් ඇස්තමේන්තු කර තිබූ අතර එයින් 2016 වර්ෂය තුල මුදලින් අයවී තිබුණේ රු.12,441,000 ක් පමණි. ඒ අනුව ගිණුමෙහි පෙන්වා තිබූ රු.26,221,470 කින් රු.13,780,470 ක් 2016 වර්ෂයට අදාල නොවූ අතර වර්ෂයට අදාල මුළු ආදායමෙන් අවසාන ගිණුම තුලින් පිළිබිඹු වූයේ සියයට 18 ක් පමණි.

(ආ) බස්නාහිර පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 39/96 මගින් වර්ෂයට අදාල බදු මුදල් එම වර්ෂය තුලින්ම එකතු කර ගැනීමට ඒවායේ පරිපාලන ප්‍රධානින් කටයුතු කලයුතු බව දන්වා තිබුණත් කොළඹ මහා නගර සභාව විසින් ව්‍යාපාර බදු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(i) 2016 වර්ෂයේ වෙළඳ බදු සාරාංශය අනුව සභාවට ලැබිය යුතු වෙළෙඳ බදු ආදායම රු.67,796,000 ක් වුවත් සත්‍ය වශයෙන් අයකර තිබුණේ රු.12,441,000 ක් පමණි. මේ නිසා 2016 වර්ෂය සඳහා හිඟ ආදායම රු.55,385,000 ක් වූ අතර එය ලැබිය යුතු ආදායමෙන් සියයට 82 ක් විය.

(ii) කොළඹ මහා නගර සභාව සතුව වෙළඳ බදු අයවිය යුතු ස්ථාන 18,823 ක් 2016 වර්ෂයේ හඳුනාගෙන තිබූ අතර එයින් වර්ෂ අවසානයේ බදු ගෙවා තිබුණේ ව්‍යාපාරික ස්ථාන 3,033 ක් පමණි. ඒ අනුව ව්‍යාපාරික ස්ථාන 15,790 කින් 2016 වර්ෂයේදී බදු අයවී නොතිබුණි.

(ඇ) සභාව විසින් වෙළඳ බදු කොට්ඨාශ 47 කට බදු අංකනය කර තිබූ අතර එහිදී කොට්ඨාශ 08 ක බදු අයවීමේ ප්‍රගතිය සියයට 7.8 සිට 13.7 දක්වා පහල මට්ටමක පැවතුණි.

**2.3.3 සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්, භෝජනශාලා හා නවාතැන්පල වලින් වෙළඳ බලපත්‍ර ගාස්තු**

2016 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ බලපත්‍ර ලබාගතයුතු ආයතන 132 ක් හඳුනාගෙන තිබූ අතර එයින් ආයතන 107 කින් රු.45,091,444 ක් අයවී තිබුණි. ආයතන 2 ක් වසාදමා තිබූ අතර ආයතන 25 ක් ගෙවීම් කර නොතිබුණි. මෙසේ ගෙවීම් පැහැර හරින ආයතන වලින් වැඩි ප්‍රමාණයක් 2008 වර්ෂයේ සිට ගෙවීම් පැහැර හැර තිබූ අතර ඒවා සැලකිය යුතු ආදායමක් ලබන ප්‍රධාන පෙළේ ආයතනබව නිරීක්ෂණයවිය . මෙසේ සභාවට අහිමි වූ ආදායම් අයකර ගැනීම සඳහා කඩිනම් පියවර ගෙන නොතිබූ අතර සභාව විසින් එම ආයතන සඳහා තම සේවාවන් අඛණ්ඩව සපයා තිබුණි.

**2.3.4 කල්බදු කඩ සාප්පු ආදායම්**

**------------------------------**

ආදායම් අංශයේ නඩත්තු කරන කල්බදු කඩ සාප්පු ආදායම් ලේඛනයේ බොහෝ කඩ සාප්පු සම්බන්ධව කල්බදු කාලසීමාව පිළිබඳව වාර්තා සටහන් නොකිරීම නිසා එම ලේඛනය සමඟ ආදායම් ලැබීම් වාර්තා සංසන්දනය කිරීමට නොහැකි විය. තවද කල්බදු කඩ සාප්පු ආදායම් ලේඛනයේ කල්බදු කාලසීමාව පිළිබඳව සටහන් නොවූ අවස්ථා පහක් විය.

**2.3.5 විනෝද බදු**

**-------------**

**(අ) ප්‍රසංග, සංගීත සංදර්ශන හා ක්‍රීඩා තරඟ විනෝද බදු**

**------------------------------------------------------**

කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය තුල 2016 වර්ෂය තුලදී පැවැත්වූ ප්‍රසංග, සංගීත සංදර්ශන හා ක්‍රීඩා තරඟ සඳහා අයකල විනෝද බදු මුදල රු.84,235,644 ක් විය. පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත රු.30,324,273 ක විනෝද බදු නිදහස් කිරීමේදී යථෝක්ත ප්‍රසංගය/ තරඟ පැවැත්වීමෙන් ලැබෙන ආදායම උක්ත පදනම විසින් සිදුකරන ප්‍රජා සත්කාර/ පාසැල් සංවර්ධනය සඳහා එම අරමුදල් යෙදවීම සහ ඒ අයුරින් කටයුතු කල බවට තහවුරුවක් ප්‍රසංගය/ තරඟය පවත්වා අවසන් වූ දින සිට දින 30 ක් ඇතුලත, සංවිධායකයින් විසින් අදාල පළාත් පාලන ආයතනය වෙත ඉදිරිපත් කල යුතු බව නියම කර ඇතත් ප්‍රවේශ පත්‍ර අලෙවියෙන් ලද ආදායම (60%) ප්‍රජා සත්කාර/ පාසල් සංවර්ධනය සඳහා යෙද වූ බවට තහවුරු කර නොගෙන විනෝද බදු මුදල නිදහස් කර තිබුණි.

**(ආ) සිනමාශාලා විනෝද බදු**

**--------------------------**

**(i)** කොළඹ නගර සීමාව තුල ක්‍රියාත්මක සිනමාශාලා 24 න් 2016 වර්ෂයට අදාල සිනමාශාලා විනෝද බදු මුදල රු.63,770,318 ක්වූ අතර මින් රු.17,166,725 ක් සමාලෝචිත වර්ෂය අවසානයට අයවීමට තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට විනෝද බදු සමුච්චිත හිඟය රු.33,060,432 ක් විය.

**(ii)** හිඟ විනෝද බදු ලිපිගොනුව හා සිනමාශාලා ගාස්තු අයවීමේ ලේඛණය සමඟ විෂය ලිපිකරුගේ තොරතුරු සැසඳීමේදී 2016 වර්ෂය සඳහා බිල්කල ආදායමෙහි රු.2,944,365 ක් හා 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟයෙහි රු.10,022,778 ක වෙනසක් නිරීක්ෂණය විය.

විනෝද බදු මුදල ඊලඟ මාසයේ 15 වෙනිදාට පෙර නිරවුල් කරන ලෙස සිනමාශාලා දැනුවත් කිරීම ආදායම් පරීක්ෂකයින්ගේ රාජකාරිය විය යුතු වුවත්, නිරවුල් කිරීමට මාස 02 සිට මාස 12 කට වැඩි කාලයක් ගත වී ඇති බව නිරීක්ෂණය විය. සිනමාශාලා 25 කින් අයකර ගතයුතු රු.23,037,654 ක් 2011 වර්ෂයේ සිට හිඟව පැවතුනත් 1946 අංක12 දරන විනෝද බදු ආඥා පනතේ 6 ඡේදය පරිදි අයකර ගැනීමට නීත්‍යානුකූල පියවර ගෙන නොතිබුණි.

**2.3.6 වෙළඳ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ගාස්තු**

**-------------------------------------**

පහත නිරීක්ෂණයන් කෙරේ.

**(අ)** දිස්ත්‍රික් කාර්යාලයට අදාල බල ප්‍රදේශය තුළ ස්ථාපනය කර ඇති ව්‍යාපාර ආයතන, නව ව්‍යාපාර ආයතන, ඉවත් වු ව්‍යාපාර ආයතන හා ව්‍යාපාර ආයතන වලින් බැහැර කරන කසළ ප්‍රමාණය පිළිබඳ වාර්ෂිකව ක්‍රමවත් සමීක්ෂණයක් සිදු නොවීම නිසා යාවත්කාලීන නොවු වෙළඳ ව්‍යාපාර සම්බන්ධ තොරතුරු මත වෙළඳ අපද්‍රව්‍ය ඉවත් කිරීම් ගාස්තු අය කරමින් පැවති අතර ආදායම් අයකිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීම කෙරෙහි ප්‍රමාණවත් අවධානය යොමු කර නොතිබුණි.

**(ආ)** දිස්ත්‍රික් කාර්යාල 03 හි 2016 වර්ෂය සඳහා අයවිය යුතු වෙළඳ අපද්‍රව්‍ය ඉවත් කිරීම් ගාස්තුව රු.3,464,000 ක් වුවත් තත්‍ය අයවීම් රු.1,401,000 ක් වීම නිසා වෙළඳ අපද්‍රව්‍ය ආදායම් අය වීමේ ප්‍රතිශතය 2016 ඔක්තෝබර් 30

වන විට සියයට 40 ක් වැනි අඩු මට්ටමක පැවතුනි. තවද, වෙළඳ අපද්‍රව්‍ය ඉවත් කිරීම වෙනුවෙන් 2016 ඔක්තෝබර් 30 දින වන විට හිඟ ආදායම රු.4,571,700 ක් වූ අතර අනු නීති පරිච්ඡේද xxv ප්‍රකාරව ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ)** වර්ෂය තුළ නිකුත් කරන නිවේදන සඳහා මුදල් ගෙවීම් පිළිබඳ තොරතුරු, සරප් අංශයෙන් මාසිකව හෝ ත්‍රෛමාසිකව උප කාර්යාලයේ පවත්වා ගෙන යනු ලබන ආදායම් රැස්කිරීම් ලේඛණයේ යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් හිඟ ආදායම් පිළිබඳ නිවැරදි තොරතුරු ලබා ගත නොහැකි විය.

**(ඈ)** නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව හා දිස්ත්‍රික් කාර්යාල අතර විධිමත් තොරතුරු සන්නිවේදනයක් සිදු නොවීම හේතුවෙන් සහා බල ප්‍රදේශය තුළ ආරම්භ කරන නව වෙළඳ ව්‍යාපාර සඳහා සභාව විසින් වෙළඳ බලපත්‍ර නිකුත් කල පසු එම වෙළඳ ව්‍යාපාර සම්බන්ධ තොරතුරු ලබා ගැනීමේ හැකියාව මඟ හැරී තිබුණි.

**2.3.7 ආයෝජන පොළී ආදායම්**

-----------------------------

2016 ජනවාරි 01 දින වන විට රු.100,000,000 ක මුදලක් හා 2016 වර්ෂය තුල රු.80,000,000 ක මුදලක් සත්දින තැන්පතු යටතේ ආයෝජනය කර තිබුණි. මෙම මුදල් සියයට 3.5 ක පමණ අඩු පොළී අනුපාතයක් යටතේ ආයෝජනය කර තිබීම හේතුවෙන් 2016 වර්ෂය සඳහා රු.3,452,055 ක පොළී ආදායමක් ලැබී තිබුණි. මෙම මුදල සත්දින තැන්පතු වල ආයෝජනයකර තිබුනේ කෙටිකාලීන කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වුවද, 2017 ජනවාරි 01 දින දක්වාම මුදල් කරගෙන නොතිබුණි. මෙම මුදල රාජ්‍ය බැංකුවල ස්ථිර තැන්පතු සඳහා එදිනට පැවති සනාථ කරගත් අඩුම පොළී අනුපාතය සියයට 6.5 ක් සමඟ සැසඳීමේදී වර්ෂයකට අවම වශයෙන් රු.3,000,000 ක පමණ පොළී ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

**2.4 අධිභාර**

--------

මහා නගර සභාව වෙත ඉකුත් වර්ෂවලදී මවිසින් නිකුත් කර තිබූ අධිභාර සහතික 05 ක් වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු.357,979 ක් අයවිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

**3.1.1 කොළඹ මහා නගර සභා නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම.**

---------------------------------------------------------------------

**(අ)** යථෝක්ත ඉදිකිරීම 2016 ජනවාරි 31 දිනට අවසන් කලයුතු වුවද 2017 දෙසැම්බර් 15 දින වන විටත් අවසන්කර නොතිබුණි.

**(ආ)** 2016 ජනවාරි 31 න් පසුව 2016 සැප්තැම්බර් 14 දින දක්වා ප්‍රමාද කාලයට මුළු ප්‍රමාද ගාස්තුව වශයෙන් රු.75,509,312 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

**(ඇ)** ප්‍රමාන පත්‍රය සහ සත්‍ය ඉදිකිරීම් අතර සියයට 10 සිට සියයට 893 ක් දක්වා විචලනයක් තිබූ බැවින් විධිමත් අයුරින් ඇස්තමේන්තු සකස් කිරීමක් සිදුව නොතිබුණි.

**3.1.2 පැරණි නගර ශාලා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට උපදේශක සේවාව ලබා ගැනීම.**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ)** පැරණි නගර ශාලා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ කාර්යය සඳහා නිශ්චිත කාල රාමුවක් නොතිබීම හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුවට අදාල ලංසු ලේඛන, ප්‍රමාණ පත්‍ර හා පිරිවිතරයන් මනින ලද සැලසුම් පිළියෙල කිරීමේ කාර්යය වෙනුවෙන් පමණක් වර්ෂ 02 කට ආසන්න කාලයක් හා උපදේශන සේවාව ලබා ගැනීම සඳහා සභා තීරණය ගත් දින සිට දීර්ඝ කාලයක් ගත වී තිබුණි.

**(ආ)** සම්පූර්ණ ඉදිකිරීම් මුදලෙන් සියයට 8 ක වෘත්තිය ගාස්තුවක් උපදේශක සමාගමට ගෙවීමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී අනුමත කර තිබුණද ඒ වන විට සම්පූර්ණ ඉදිකිරීමේ ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. 2015 මැයි 06 දින උපදේශක ආයතනය රු.මි.363 කට ආසන්න පිරිවැය විග්‍රහයක් ඉදිරිපත් කර තිබුණද මුළු ඉදිකිරීම් පිරිවැය නිශ්චිත නොවීම හේතුවෙන් උපදේශන ගාස්තුවද නිශ්චිතව හදුනාගත නොහැකි විය.

**3.1.3 ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තු නිලධාරීන්ට නිල ඇඳුම් හා පාවහන් මිලදී ගැනීම.**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** 2016 ජනවාරි 11 දිනැති අංක 05/2016 දරන ගිවිසුම් ප්‍රකාරව අයිතම් වර්ග 04 ක් රු.788,451 කට සැපයීමට සැපයුම්කරු එකඟවී තිබු නමුත් 2016 ඔක්තෝම්බර් 21 දින වන විටත් සපයා නොතිබීම හේතුවෙන් දෙපාර්තමේන්තු නිළධාරීන්ගේ නිල ඇඳුම් අවශ්‍යතාවය සපුරා නොතිබුණි.

**(ආ)** සැපයුම නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත් වීම නිසා කාර්යය සාධන බැඳුම්කරය මගින් එය ආවරණය කර ගත හැකිව තිබු නමුත් සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන ලද අංක 06/2016 දරන කාර්යය සාධන බැඳුම්කරය 2016 ජුලි 08 දින වන විට කල් ඉකුත් වී තිබුණි.

**(ඇ)** 2015 ඔක්තෝබර් 19 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව වැඩි මිල ඉදිරිපත් කළ සැපයුම්කරු වෙතින් මිලදී ගැනීමට නිර්දේශ කර තිබුණු නමුත් දෙවන මිල ප්‍රතික්ෂේප කිරීම සඳහා ප්‍රමාණවත් කරුණු පදනම් කරගෙන නොතිබුණි. වර්ෂයක කාලයක් සඳහා භාවිතා කිරීම අපේක්ෂාවෙන් මිලදී ගන්නා මෙම අයිතමය වෙනුවෙන් වැඩි මිල ඉදිරිපත් කල සැපයුම්කරු තෝරා ගැනීම නිසා රු.552,720 ක් වැඩිපුර වැය කිරීමට සිදුව තිබුණි.

**3.1.4 අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තාවන්ට මහන මැෂින් ලබා දීම.**

2016 වර්ෂයේදී අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා වටිනාකම රු.29,672,810 ක් වූ මහන මැෂින් 1218 ක් තෝරාගත් කාන්තාවන් අතර බෙදා දී තිබුණි. නියැදි පරීක්ෂාවට අනුව මහන මැෂින් 39 සම්බන්ධයෙන් නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

**(අ)** තෝරාගත් ප්‍රතිලාභීන් 39 දෙනෙකු අතරින් 06 දෙනෙක් පමණක් මැහුම් පාඨමාලා හදාරා තිබුණි.

**(ආ)** මැහුම් ක්ෂේත්‍රයේ ව්‍යාපාරයක් පවත්වාගෙන ගොස් තිබුණේ 07 දෙනෙකු පමණි.

**(ඇ)** මහන මැෂින් ලබාදුන් ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් පසු විපරමක් සිදුකර නොතිබුණි.

**3.1.5 නියෝජ්‍ය ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී පත්වීම (ක්ෂුද්‍ර ජීවී හා රසායනික සේවා)**

1986 වර්ෂයේදී සෝවියට් සමාජවාදී සමුහාණ්ඩුවේ වෛද්‍ය උපාධියක් හදාරා තිබු උපාධිධාරිණියකට 1965 අංක 16 දරන වෛද්‍ය ආඥා පනතට අනුව ශ්‍රී ලංකාවේ වෛද්‍යවරයෙකු ලෙස පෙනී සිටීම සඳහා සුදුසුකම් නොතිබියදී හා ආධුනික වෛද්‍යවරියක ලෙස පත් කිරීමට පෙර තිබිය යුතු සීමාවාසික පුහුණුවක් නොතිබියදී පළාත් පාලන සේවා

කොමිෂම විසින් කොළඹ මහා නගර සභාවේ ආධුනික වෛද්‍ය තනතුරක් 1989 ජුලි 31 දින පිරිනමා 1989 සැප්තැම්බර් 08 දින සිට පළාත් පාලන සේවයේ වෛද්‍ය නිළධාරී II ශ්‍රේණියට පත්කර තිබුණි. බස්නාහිර පළාත් වෛද්‍ය නිළධාරීන්ගේ සේවා ව්‍යවස්ථාවට අනුව නියෝජ්‍ය නාගරික වෛද්‍ය නිළධාරී (ක්ෂුද්‍ර ජීවී) තනතුර සඳහා තිබිය යුතු පශ්චාත් උපාධි ඩිප්ලෝමාව නොතිබියදී පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම වෛද්‍යවරියට විශේෂඥ වෛද්‍ය නිළධාරී තනතුරක් (නියෝජ්‍ය ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී - ක්ෂුද්‍ර ජීවී හා රසායනික සේවා) 2005 අප්‍රේල් 29 දින සිට ලබා දී තිබුණි.

**3.1.6 නිල නිවාස**

**------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ)** නගර සභාව සතු සෑම නිල නිවාසයක් පිළිබඳ තොරතුරු ඇතුලත් ගොනුවක් සහ පොරොත්තු ලේඛනයක් සභාවේ මධ්‍යගතව පවත්වාගෙන ගොස් නොතිබුණි.

**(ආ)** සභාව සතු නිල නිවාස ඒ ඒ නිළධාරීන්ට වෙන්කර දීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට බලය ලබාදී තිබූ බවට තොරතුරු විගණනයට අනාවරණය නොවූ නමුත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිල නිවාස වෙන්කර දීමට කටයුතුකර තිබුණි.

**(ඇ)** කොළඹ මහා නගර සභාවේ විවිධ දෙපාර්තමේන්තු වලට අයත් නිල නිවාස වැඩි ප්‍රමාණයක නීතිමය හිමිකමක් නොමැති පුද්ගලයින් වසර 10 ක පමණ කාලයක සිට අනවසරයෙන් පදිංචි වී සිටින බව අනාවරණය විය.

**(ඈ)** නිල නිවාස 09 ක කිසිවෙකු පදිංචි වී නොතිබුණි.

**(ඉ)** එක් එක් දෙපාර්තමේන්තුවට වෙන්කර ඇති නිල නිවාසවල වෙනත් දෙපාර්තමේන්තුවල සේවය කරන නිළධාරීන්, සේවකයින් පදිංචි වී සිටි අතර ස්ථාන මාරුවී ගිය නිළධාරීන්ද තවදුරටත් පෙර පරිදිම නිල නිවාස වල පදිංචි වී සිටින අවස්ථා පැවතුනි.

**3.2 නිෂ්ක්‍රීය වත්කම්**

**-----------------**

**(අ)** සභාව සතු රු.26,624,000 ක් වටිනා වාහන දෙකක් 2016 ජුලි 01 දින සිට 2017 ඔක්තෝබර් 30 දින දක්වා වසරකට අධික කාලයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නගරාධිපති නිල නිවාස පරිශ්‍රයෙහි ගාල් කර තිබුණි.

**(ආ)** ටිපර් රථයක්, ට්‍රැක්ටරයක් හා ට්‍රේලර් 03 ක් දිගු කාලක සිට භාවිතයට නොගෙන කාර්යාල පරිශ්‍රය තුළ ගාල්කර තිබුණි.

**(ඇ)** අළුත්වැඩියා කටයුතු නිම නොවී කාලයක සිට කර්මාන්තශාලා පරිශ්‍රයේ ගාල් කර තිබූ ක්‍රියාවිරහිත වූ වාහන 49 ක් නිරීක්ෂණය විය. ක්‍රියාවිරහිත වූ වාහන අතර ගාබේජ් ප්‍රෙස් පැක් 14 ක්, ට්‍රැක්ටර්13 ක්, බුල්ඩෝසර් 01 ක්, බැකෝලෝඩර් 02 ක්, ජේසීබී 01 ක්, ටිපර් 05 ක්, ලොරි 02 ක්, කාර් 01 ක්, වෑන් 01 ක් සහ ක්‍රෑ කැබ් 01 ක් විය.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------**

**3.3.1 ගිනි නිවීම් සඳහා යොදා ගනු ලබන ෆෝම් සාන්ද්‍රන**

**------------------------------------------------------**

2009 වර්ෂයේ සිට 2016 ඔක්තෝබර් 20 කාලපරිඡේදය තුළ ෆෝම් ලීටර් 4200 ක් පමණ හානි වී තිබුණි. මේ සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොවීම, බැරල් නිසි පරිදි ඇසුරුම් නොකිරීම, එලිමහනේ බැරල් තැබීම නිසා පිපිරී යාම යනාදී කරුණු හේතු වී තිබුණි. මේ අනුව ඉහත කාලපරිඡේදය තුළ සත්‍ය පරිභෝජනයට වඩා හානිවූ තොග ප්‍රමාණය ඉහළ අගයක් ගෙන ඇති බව නිරීක්ෂණය විය.

**3.3.2 කොළඹ මහා නගර සභාව සතුව පවතින ඉඩම්, ගොඩනැගිලි හා දේපළ පරිපාලනය කිරීම**

**(අ) වරිපනම් අංක 43, බාන්ස් පෙදෙස, කුරුඳුවත්ත පිහිටි ඉඩම**

වරිපනම් මුදල් නොගෙවීම මත වරිපනම් අංක 43, බාන්ස් පෙදෙස, කුරුඳුවත්ත යන ලිපිනයෙහි පිහිටි පර්චස් 154.43 ක ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම 1974 වර්ෂයේදී කොළඹ මහා නගර සභාව වෙත පවරාගෙන තිබුණි. 2017 දෙසැම්බර් මාසය වන විටත් මෙම ඉඩමෙහි භුක්තිය නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) කොළඹ 05, හැව්ලොක් පාර, අංක 149/5 දරන කල්බදු දී ඇති දේපළ**

කොළඹ මහා නගර සභාවට අයත් කොළඹ 05, හැව්ලොක් පාර, අංක 149/5 දරන ස්ථානයේ පිහිටි පර්චස් 06 ක ඉඩම 1986 ජුනි 17 දින සිට 2016 ජුනි 14 දින දක්වා අවුරුදු 30 ක කාලසීමාවකට මාසික කුලිය රු.700 කට බදු දී තිබුණි. මෙම ඉඩමෙහි තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ව්‍යාපාර ආයතන 03 කට සභාවේ අනුමැතියකින් තොරව අතුරු බදු දී තිබුණු නමුත් අධික වාණිජ වටිනාකමක් ඇති මෙම පරිශ්‍රය නැවත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) පුද්ගලික මල්ශාලාවක් ඉදිකිරීම**

කොළඹ බොරැල්ල පුද්ගලික මල් ශාලාවක් හා සුසානභූමි භාරකරුගේ නිල නිවාස අතර මහා නගර සභාවට අයත් ඉඩම් කොටසක පුද්ගලික ආයතනයක් විසින් අවමංගල්‍ය සේවාවන් සිදුකරන මල් ශාලාවක් ලෙස දෙමහල් ගොඩනැගිල්ලක් අනවසරයෙන් ඉදිකර තිබුණි. මෙම අනවසර ඉදිකිරීමට එරෙහිව මහා නගර සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(ඈ) නිවාස සංකීර්ණ**

කොළඹ මහා නගර සභාව විසින් පරිපාලනය කරනු ලබන නිවාස සංකීර්ණ 19 හි නිවාස ඒකක 828 ක් පවතින අතර මේ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(i)** මෙම නිවාස සංකීර්ණවල පදිංචිකරුවන්ගෙන් නාමික කුලියක් පමණක් අය කර තිබූ අතර වර්තමානයේ වෙළෙඳපොළ වටිනාකම අනුව සාධාරණ වාණිජ කුලියක් අය කිරීමට මහා නගර සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**(ii)** ඇතැම් නිවාස සංකීර්ණයන්හි නිවාස අවුරුදු 37 කට වැඩි කාලයක සිට කුලී පදනම යටතේ ලබා දී ඇති අතර නිවැසියන්ගේ පදිංචියට සුදුසු ආකාරයට මෙම නිවාස අළුත්වැඩියා කර දීම හෝ සාධාරණ කුලියක් අයකිරීමට මහා නගර සභාව කටයුතු කර නොතිබුණි. එමෙන්ම එම නිවාස සංකීර්ණවල බිම් මහල දෙපස අනවසර පදිංචිකරුවන් පදිංචි වී තිබූ අතර ඒ සම්බන්ධයෙන් මහා නගර සභාව දැනුවත් වී නොතිබුණි.

**(iii)** 2016 දෙසැම්බර් 31 දිනට එක් එක් නිවාස සංකීර්ණ වලින් නගර සභාව විසින් අයකර ගත යුතු හිඟ කුලී ආදායම රු.3,177,806 ක් වූ අතර හිඟ කුලී ආදායම අයකිරීම සහ එසේ හිඟව පැවතීම වැලැක්වීම පිණිස විධිමත් ක්‍රම වේදයක් සකස් කිරීමට කොළඹ මහා නගර සභාව අපොහොසත් වී තිබුණි.

**(ඉ) ක්‍රීඩාපිටි කල්බදු පහසුකම් යටතේ ලබා දීම.**

**(i) හැව්ලොක් ක්‍රීඩා පිටිය**

අක්කර 04 රූඩ් 01 පර්චස් 25.1 ක් හැව්ලොක් ක්‍රීඩා සමාජය සඳහා දීර්ඝකාලීන කල්බදු පහසුකම යටතේ ලබා දී තිබුණි. 2009 ජනවාරි මස 23 දින නාගරික තක්සේරුකරු විසින් සිදු කරන ලද සමීක්ෂණයේදී භූමි ප්‍රමාණය අක්කර 03 රූඩ් 03 පර්චස් 35.8 ක් බවට දක්වා තිබුණු අතර මුල් ගිවිසුමට වඩා පර්චස් 69.3 ක් අඩුවීම සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. ක්‍රීඩා භූමිය තුළ ප්‍රචාරක පුවරු සවිකර විශාල ආදායමක් උපයන අතර, සමාජිකයන්ට මත්පැන් අලෙවි කිරීම සඳහා අලෙවිසැළක්ද පවත්වාගෙන යනු ලබයි. ඉහළ වාණිජ වටිනාකමක් ඇති මෙම භූමිය සඳහා නිවැරදි තක්සේරුවක් සිදුකර ආදායම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ii) BRC ක්‍රීඩා පිටිය**

---

අක්කර 04 රූඩ් 02 පර්චස් 13.83 ක භූමි භාගයක් දීර්ඝකාලීන කල්බදු පහසුකම් යටතේ ලබා දී තිබුණි. ක්‍රීඩා භූමිය තුළ පෞද්ගලික ආයතනවල දැන්වීම් පුවරු ප්‍රචාරණය සඳහා දී ඇති අතර මත් පැන් අලෙවිසැලක් හා කායවර්ධන මධ්‍යස්ථානයක් තට්ටු 04 ගොඩනැගිල්ලක් තුල පවතින බවත් අනාවරණය වී තිබුණි. 2006 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාල ක්‍රීඩා සමාජයෙන් රු.75,000 ක මාසික කුලියක් (බදු රහිත) අයකිරිමට තීරණය කර තිබු නමුත් විශාල ආදායමක් ඉපයිය හැකි දේපළක් බාහිර පාර්ශවයක් වෙත අවම බදු කුලියට ලබා දී තිබුණි.

**(iii) කෝල්ට්ස් ක්‍රීඩා පිටිය**

---

කොළඹ කෝල්ට්ස් ක්‍රිඩා සමාජය සඳහා අක්කර 07 රූඩ් 03 පර්චස් 26.7 ක් දීර්ඝකාලීන බදු පදනම මත ලබා දී තිබුණද 2009 ජනවාරි මස 23 දින නාගරික තක්සේරුකරු විසින් ඉදිරිපත් කර තිබු වාර්තාව අනුව එහි භූමි ප්‍රමාණය අක්කර 05 රූඩ් 02 පර්චස් 4.54 ක් විය. ඒ අනුව අක්කර 02 රූඩ් 01 පර්චස් 22.16 ක් අඩුවීම පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. 2006 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සහ වසර 05 කින් අදාල කල්බදු වාරිකය සංශෝධනය වන පරිදි මසකට රු.90,000 (බදු රහිතව) අයකිරිමට තීරණය කර තිබුණි.

**3.4 හඳුනාගත් අලාභ**

---

දිස්ත්‍රික් 2B කාර්යාල ගබඩාවේ තොග පරීක්ෂාවේදී රු.36,000 ක් වටිනා තීන්ත ලීටර් 115 ක් කල් ඉකුත් වී තිබුණි.

**3.5 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

---

**(අ)** 2009 අප්‍රේල් 27 දින ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SC/FR/218/09 දරන තීරණය මගින් මීතොටමුල්ල ප්‍රදේශයේ අක්කර 02 ක භූමි ප්‍රමාණයකට තාවකාලිකව කසළ බැහැර කිරීම සඳහා අවසර ලබා දී තිබු නමුත් අක්කර 20 ක භූමි ප්‍රමාණය දක්වා කසළ අවිධිමත් පරිදි බැහැර කර තිබුණි. එසේම කසළ බැහැර කිරීමට භූමියක් සභාවට මිලදීගෙන කසළ ප්‍රතිචක්‍රීකරණ කටයුතු කිරීම සඳහා දිගු කාලීන සැලැස්මක්ද සභාව විසින් සකස් කර නොතිබුණි. වර්තමානයේ මුතුරාජවෙල ප්‍රදේශයට තාවකාලිකව කසළ බැහැර කරගෙන ගියද ඒ සඳහාද මහජන විරෝධතා පැනනැගීම නිසා මේ වන විට ශ්‍රේෂ්ඨාධිකරණයේ පැමිණිල්ලක්ද ගොනු කර තිබුණි.

**(ආ)** කසළ අංගනයේ කටයුතු සඳහා අවශ්‍ය බුල්ඩෝසර් හා එක්ස්කැවේටර් මිලදී ගැනීම වෙනුවෙන් 2012, 2014 හා 2016 යන වර්ෂයන්හිදී වාර්ෂික අයවැය මගින් එකතුව රු.81,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද එම වාහන මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එක්ස්කැවේටර් හා බුල්ඩෝසර් කුලී පදනම මත ලබාගෙන 2010 සිට 2016 දක්වා රු.680,656,697 ක් කුලී වශයෙන් ගෙවා තිබුණි. 2015 අප්‍රේල් 30 දිනැති සභා තීරණ අංක 2117 මගින් සභාව සතු බුල්ඩෝසරය හා ලෝඩර් රථය ඉක්මණින් අළුත්වැඩියා කර එය කසළ අංගනයේ කටයුතු සඳහා යොදා ගැනීමටත් ඉන්පසු ඒවා පිටතින් කුලියට නොගැනීමටත් තීරණය කර තිබුණද 2016 වර්ෂයේදී පුද්ගලික සමාගමකට අළුත්වැඩියාව සඳහා යවා තිබු බුල්ඩෝසරය හා ලෝඩර් රථය 2017 මැයි මස වන විටත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ)** ඝණ අපද්‍රව්‍ය පවිත්‍රතා අංශයට ප්‍රමාණවත් වාහන තිබියදී කසළ ප්‍රවාහනය සඳහා හදිසි මිලදී ගැනීම් උපදෙස් යටතේ ටිපර් රථ 06 ක් පුද්ගලික සමාගමකින් කුලී පදනම මත ලබාගෙන රු.59,628,833 ක මුදලක් 2015 ජුනි සිට 2017 මැයි 12 දක්වා ගෙවා තිබුණි.

**(ඈ)** ටෙන්ඩර් කැඳවීමකින් තොරව 2016 සැප්තැම්බර් 06 දින අංක 178 දරන සභා තීරණය මගින් නව සභාවක් තේරීපත් වන තෙක් එකම පෞද්ගලික සමාගමකින් මේ දක්වාම කුලී වාහන ලබාගෙන තිබුණි.

**(ඉ)** ඝණ අපද්‍රව්‍ය අංශයේ නාගරික ඉංජිනේරුවරියකට අවස්ථා 07 කදී ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් විදෙස් පුහුණුව ලබාදී තිබුණද එසේ ලබාගත් විදෙස් පුහුණුව, කසළ ප්‍රතිචක්‍රීකරණ කටයුතු කිරීම වැනි දිගුකාලීන සැලසුම් සකස් කර ගැනීමට මෙතෙක් උපයෝගී කරගෙන නොතිබුණි.

**3.6 මීතොටමුල්ල කසළ අංගනය නිසා විපතට පත් ජනතාවට වන්දි ගෙවීම්**

---

(අ) කසළ අංගනය හේතුවෙන් අගතියට පත් අවට ජීවත්වන පවුල් වලට වන්දි ගෙවීම 2012 වර්ෂයේ ඔක්තෝම්බර් මස ආරම්භ කර තිබුණු අතර මේ වන විට අදියර 8 ක් යටතේ වන්දි ලෙස රු.605,914,020 ක් ගෙවා තිබූ නමුත් මේ සඳහා මහා නගර සභා ආඥා පනතේ 188 වගන්තිය ප්‍රකාරව ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) කොළොන්නාව කසළ අංගනය ආශ්‍රිත ප්‍රදේශයට කසළ බැහැර කිරීම නිසා විපතට පත් ජනතාව වෙනුවෙන් 2012 වර්ෂයේදී රු.මිලියන 237 ක මුදලක් වැය කර නාගරික සංවර්ධන අධිකාරියට අයත් සාල මුල්ල නිවාස ව්‍යාපෘතිය මගින් නිවාස 158 ක් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) විපතට පත් ජනතාව මෙහි පදිංචිකරුවන් බවට කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් සහ කොළොන්නාව නගර සභාව විසින් සමීක්ෂණ 02 ක් සිදුකර තිබූ අතර එම වාර්තා 02 හි පරස්පරතාවයන් නිරීක්ෂණය වී තිබුණි.

(ii) නිවාස ලබා දීමට ප්‍රථම කොළඹ මහා නගර සභාව විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදු කර නිත්‍ය පදිංචිකරුවන් හඳුනාගෙන නොතිබුණි.

(iii) මෙම පුද්ගලයින් සඳහා වන්දි ලබා දීම වෙනුවෙන් වන්දි මුදල් තීරණය කිරීම සඳහා පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුගමනය කර නොමැති අතර වන්දි මුදල තීරණය කර ඇත්තේ කසළ අංගනය නිසා පීඩාවට පත් අනවසර පදිංචිකරුවන් කැඳවා කොළඹ නගර සභාව විසින් පවත්වනු ලැබූ රැස්වීමක් මගිනි.

(iv) මෙම වන්දි මුදල් ලබා දීමේදී අදාල පුද්ගලයන් මෙහි ස්ථිර පදිංචිකරුවන් බව සහ ඔවුන් මෙහි දීර්ඝ කාලයක් වාසය කල බව තහවුරු කිරීම සඳහා තහවුරු ලේඛණ ලබාගත යුතු වුවද කොළඹ නගර සභාව විසින් සකස් කරන ලද "හානියට පත්වූ නිවාස සහ කුටුම්බ පිළිබඳ විස්තර" නම් පත්‍රිකාවෙන් ලබාගත් තොරතුරු පදනම් කරගෙන ස්ථිර පදිංචිකරුවන් බව හා දීර්ඝ කාලයක් වාසය කල බව තහවුරු කර තිබුණි. මෙමගින් එම නිවාස ලාභීන්ගේ ස්ථිර පදිංචිය සහ එහි දීර්ඝ කාලයක් පුරා වාසය කල බවට ලිඛිත තොරතුරු ප්‍රමාණවත් පරිදි රැස් කර නොතිබුණි.

(ඇ) ගිවිසුම ප්‍රකාරව වන්දි ලාභීන් විසින් මසක් ඇතුළත නිවාස කඩා ඉවත් කළ යුතු වුවත් 6 වන අදියරදී ආපදා ලාභීන් දෙදෙනෙකු රු.ලක්ෂ 10 බැගින් ද, 7 වන අදියරදී එක් ආපදා ලාභියෙක් රු.ලක්ෂ 10 බැගින්ද, 8 වන අදියරේදී ආපදා ලාභීන් 20 දෙනෙකු රු.ලක්ෂ 10 බැගින්ද, ලබාගෙන නිවාසවලින් ඉවත් නොවී සිටින බව නිරීක්ෂණය විය. එසේම ඉහත සියලුම වන්දි ගෙවූ අදියරයන්හි වන්දි ලබා ගැනීමට ඉදිරිපත් නොවී එම නිවාස වලම ජීවත්වන ආපදා ලාභීන් විශාල පිරිසක් සිටි අතර, එම පිරිස වන්දි ලබා ගැනීමට සුදුසු එහෙත් වන්දි ලබා ගැනීමට ඉදිරිපත් නොවූ අය බැවින් ඉදිරිපත් නොවූ පිරිස කැඳවා ඔවුනට පිළිගත හැකි විසඳුමක් ලබාදීමට සභාව සමත් වූයේ නම් 2017 අප්‍රේල් 14 ඛේදවාචකය අවම කර ගැනීමට ඉඩ තිබුණි.

(ඈ) ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වාර්තාවට අනුව මීතොටමුල්ල කසළ අංගනය නායයෑම හේතුවෙන් පහත පරිදි හානි සිදුවී තිබුණි.

- පුද්ගල මරණ සංඛ්‍යාව - 32
- හානියට ලක් වූ පුද්ගලයින් ගණන - 1059
- හානියට ලක් වූ පවුල් ගණන - 246
- තුවාල ලැබූ පිරිස - 11
- අතුරුදහන් වීම් - 08
- නිවාස හානි - පරිපූර්ණ - 80
- නිවාස හානි - අඩක් 17

(ඉ) 2016 ජුනි 05 ඉරුදින ලංකාදීප පුවත්පතෙහි "කොලොන්නාව, මීතොටමුල්ල කසළ කන්ද අවට ප්‍රදේශය ඉතාම නුදුරු දිනයකදී අරණායක සාමසර කන්ද නාය යාමට වඩා බරපතල ලෙස නායයෑම් අවදානමක් ඇති විය හැකි බව විද්‍යාත්මක කරුණු මගින් සනාථ වී ඇතැයි" පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පරිසර ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ජ්‍යේෂ්ඨ කථිකාචාර්යවරයෙකු විසින් ප්‍රකාශ කර තිබූ අතර මීතොටමුල්ල කසළ කන්දෙහි උස සහ කසළ භූමියේ තිබෙන ලක්ෂණ ආශ්‍රිතව සිදුකල පර්යේෂණ ආශ්‍රයෙන් මෙම ප්‍රකාශය සිදුකර තිබුණි. රටෙහි පිළිගත් විශ්වවිද්‍යාලයක ආචාර්යවරයකුගේ ප්‍රකාශයන් පිළිබඳව, (කසළ කළමනාකරණයට අදාලව) නගර සභා නිළධාරින්ගේ අවධානය යොමුකර ඒ පිළිබඳව නිසි ක්‍රියා මාර්ග ගත්තේ නම් ඉන් මාස දහයකට පසුව මෙතරම් ව්‍යසනයක් සිදුවීම වලක්වා ගැනීමට ඉඩ ප්‍රස්ථාව තිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**-----------------------------------------**

**4.1 අයවැය පාලනය**

**------------------**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාවේ ආදායම් හා වියදම් විධිමත්ව ඇස්තමේන්තු නොකිරීම නිසා පහත සඳහන් පරිදි ඇස්තමේන්තුගත සහ තත්‍ය ආදායම්/ වියදම් අතර සියයට 11 සිට සියයට 603 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන උපක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් 04 කින් රු.මි.670.5 ක ආදායමක් ඇස්තමේන්තු කර 2016 දෙසැම්බර් 31 දිනට රු.මි.4.6 ක තත්‍ය අයවීමක් තිබූ අතර අයනොවීමේ ප්‍රතිශතය සියයට 93.9 සිට සියයට 99.9 ක ඉහළ පරාසයක් ගෙන තිබුණි.

(ආ) ආදායම් විෂයයන් 13 කින් රු. මි. 1,143.5 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණත් අයවී තිබුණේ රු.මි.256.2 ක් වූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 22.4 ක් විය.

(ඇ) ආදායම් විෂයයන් 09 ක අයවැයගත ආදායම රු.මි.168.7 ක් වූ අතර තත්‍ය අයවීම රු.මි.311.4 ක් විය. ප්‍රතිපාදන ඉක්මවා අයවීම සියයට 38.9 සිට සියයට 603.1 ක ඉහළ පරාසයක් ගෙන තිබුණි.

(ඈ) 2016 වියදම් විෂයයන් 16 ක් සඳහා රු. මි.217.9 ක වියදමක් ඇස්තමේන්තු කර තිබුණත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඉ) වියදම් විෂයයන් 10 ක් සඳහා රු.මි. 880.9 ක වියදමක් ඇස්තමේන්තු කර තිබුණත් තත්‍ය වියදම රු.මි. 58.5 ක් වූයෙන් වැය නොවීමේ ප්‍රතිශතය සියයට 86 සිට සියයට 99.4 ක ඉහළ පරාසයක් ගෙන තිබුණි.

(ඊ) වියදම් විෂයයන් 07 ක අයවැයගත වියදම රු.මි.1007 ක් වූ අතර තත්‍ය වියදම රු.මි. 1629.6 ක් විය. ප්‍රතිපාදන ඉක්මවා වැයවීමේ ප්‍රතිශතය සියයට 11 සිට සියයට 357 ක ඉහළ පරාසයක් ගෙන තිබුණි.

**5. පද්ධති හා පාලන**

**------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර නාගරික කොමසාරිස්වරයාගේ අවධානයට යොමු කළ අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ.

| **පද්ධතිය** | **අඩුපාඩුව** |
|---|---|
| (අ) ගිණුම්කරණය | i. ගිණුම් වලින් අත්හැරීම් සිදු වී තිබීම<br>ii. නිසි පරිදි ලේඛන පවත්වා නොගැනීම |
| (ආ) ආදායම් පාලනය | i. හිඟ ආදායම් නිවැරදිව එකතු නොකිරීම<br>ii. බදු තක්සේරු නිසි කලට සිදු නොකිරීම<br>ii. |

| | | |
|---|---|---|
| (ඇ) ගබඩා පාලනය | i. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු නොකිරීම |
| | ii. | සමීක්ෂණ කටයුතු වලදී සියළුම ගබඩා සමීක්ෂණයට ලක් නොවීම |
| (ඇ) වත්කම් උපයෝජනය | **i.** | මීල අධික වාහන ප්‍රයෝජනයට නොගෙන ගාල් කර තැබීම |